# පූස් අම්මයි
# කොටි අම්මයි



සඳුනි නවෝද්‍යා ආරියසේන

# පූස් අම්මයි

# කොටි අම්මයි

සඳුනි නවෝද්‍යා ආරියසේන

2024 - නොබිඳුණු මිතුදම

මහමායා බාලිකා විද්‍යාලය

10 ශ්‍රේණිය G

2026.05.10

ISBN 978-624-211-282-4

# පිදුම

උපන් දා සිට මා ඇති දැඩි කළ

මාගේ ආදරණීය

දෙමාපියනි,

මා හට සිප් සතර පාදා දෙන

මා දයාබර

ගුරු මෑණිපියවරුණි,

මාගේ මෙම පුස්තකය සාදා ගැනීමට

උදව් උපකාර කළ

ඔබ සැමට

ගෞරවයෙන්, ආදරයෙන්

මෙම පුස්තකය

පුදන්නෙමි.......

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණ ශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ

හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
(2026.05.10)

ඔන්න එකෝමත් එක ලස්සන පුංචි ගමක් තිබුණා. සැබැවින්ම මේ ගම රමණීයයි. ගම ආරක්ෂා කිරීමට මෙන් පිහිටා තිබූ යෝධ කඳු පන්තිය එහි සුන්දරත්වය තව තවත් වැඩි කළා. මේ ගමට නුදුරින් විශාල විෂඝෝර සතුන් විෂ පැළෑටි ආදය තිබුණා.

රමණීය පුංචි ගමේ ලස්සන, අහිංසක ඒ වගේම කරුණාවන්ත පූස් අම්මා කෙනෙකුයි පූස් පැටවු තුන් දෙනෙකුයි කිසිවකුට හිංසා පීඩා නොකරමින්, තමන්ට අවශ්‍ය කෑම සොයා ගනිමින් සතුටින්, සැහැල්ලුවෙන් ජීවත් වුණා.



ඒ වගේම ගමට නුදුරින් පිහිටි වනයේ නපුරු, සැර පෙනුමක් තියෙන කොටි අමමෙකුයි ලස්සන හුරුබුහුටි කොටි පැටව් දෙන්නෙකුයි ජීවත් වුණා.


03
S. P. C. Stationery Factory

දිනක් පූස් පැටවුන් තිදෙනා දුවමින් පනිමින් සෙල්ලම් කරමින් සිටියදී එතනට කොටි පැටවුන් තිදෙනා පැමිණියා. කොටි පැටවුන් තිදෙනා දැක්ක පූස් පැටවුන් බියට පත් වනු දුටු එක් කොටි පැටවෙකු මෙසේ පැවසීය.

“අනේ පූස් යාලුවනේ, අපිව දැකලා බයවෙලා දුවන්න එපා. අපි ඔයාලට කරදර කරන්නේ නෑ”

“අනේ ඔයාලගේ අම්මා හරි සැරයි නේ. ඔයාලත් එක්ක අපි කතා කරනවා

දැක්කොත් අපිට විසුමක් නෑ" පූස් පැටවෙකු පැවසීය.

"අනේ යාලුවනේ එහෙම වෙන්නේ නෑ. අපිව දකින හැමෝම බයවෙලා දුවනවා. ඔයාලවත් අපිත් එක්ක කතා කරන්නෙ නෑනේ. අපි කැමතියි ඔයාලා එක්ක සෙල්ලම් කරන්න."

"හරි එහෙනම් අපි සෙල්ලම් කරමුකෝ. හැබැයි........"

"හැබැයි.....? ඇයි මොකද?"

“හැබැයි අපිට කරදර කරන්න ඔට්ටු නෑ හොඳේ.”

“හරි, අපි ඔයාලට කිසිම කරදරයක් කරන්නේ නෑ. පොරොන්දු වෙනවා.”
“හරි එහෙනම් එන්න අපි සෙල්ලම් කරමු.”

පූස් පැටවුන් සහ කොටි පැටවුන් ඡතුටින් දුව පනිමින් සෙල්ලම් කළා. එය දුටු කොටි මව කෝපයෙන් යුතුව එතැනට පැමිණ පූස් පැටවුන්ට ගොරවමින් ඔවුන් බිය කළා. මහත් සේ බිය වූ පූස් පැටවුන් එතැනින් දිව ගියා.

“මං කියලා තියෙනවා නේද ඔය පූස් පැටව් එක්ක සෙල්ලමට යන්න එපා කියලා. අහුවුණොත් මම ඔය පූස් පැටවුන්ව ඉතුරු කරන්නේ නෑ”
කොටි මව කෝපයෙන් යුතුව පැවසීය.

“අනේ..... අනේ..... අම්මේ, පූස් පැටවුන්ට කරදර කරන්න එපා. අපියි එයාලා එක්ක සෙල්ලම් කරන්න ගියේ.” යැයි දුක්බර හඬින් යුතුව පැවසීය.

“ආයෙ පූස් පැටවු එක්ක සෙල්ලමට ගියොත් මං නපුරුයි කියන්න එපා. ගර්ර්ර්...... දැන් යමු”

කොටි මව සැර පරුෂ ස්වභාවයෙන් පැවසීය.

"අනේ අම්මෙ, අම්මේ, ඔයා කොහේද? අයියෝ එන්නකෝ...." කොටි පැටවුන් කෑ ගසමින් මව සමීපයට පැමිණියහ.

"මොකද, මොකද පැටවුනේ මේ කෑ ගහන්නේ? මොකද වුනේ?"

"අනේ අම්මේ අපි සෙල්ලම් කර කර ඉද්දි කොටි පැටවුනුත් අපිත් එක්ක සෙල්ලම් කරන්න ආවා. අපි ඉතින් එයාලා එක්ක සෙල්ලම් කරන්න ගත්තා. අපි සෙල්ලම් කර කර ඉද්දි එතෙන්ට කොටි අම්මා

ඇවිත් අපිව බය කළා.....” එක් පූස් පැටවෙකු හැඬුම් ස්වරූපයෙන් පැවසීය.

“අයියෝ දෙයියනේ..... මම කියලා තියෙනවා නේද කොටි පැටවු එක්ක සෙල්ලමට යන්න එපා කියලා. දැන් ඉතින් කමක් නෑ. කෝ මගේ පැටවු බය වෙන්න එපා. එන්න අම්මා ළගට....”

“අම්මේ කොටි අම්මා අපිට කරදර කරයිද?” එක් පැටවෙකු තම මවගෙන් විමසීය.

"අනේ අම්මේ... කියන්නකෝ.... අපට ගොඩක් බයයි...." අනෙක් පැටවුන් දෙදෙනා පැවසීය.

"හරි හරි බය වෙන්න එපා. හැබැයි ඔයගොල්ලෝ පරිස්සම් වෙන්න. හරිද? පූස් මව මහත් සන්සුන් ස්වරූපයෙන් පැවසීය.

"හරි අම්මේ, අපි පරෙස්සම් වෙන්නම්." පැටවුන් තිදෙනාම තම මවට එකග විය.



එක් දිනක් කුඩා කොටි පැටවෙකු තනිවම කැලයේ කෑම සොයමින් ඔබ මොබ සැරිසරමින් සිටියා. එවිට එක්වරම විශාල, විෂඝෝර සර්පයෙකු මේ පැටවා

අසළට පැමිණියා. සර්පයා දුටු කුඩා කොටි පැටවා බියට පත් වූවා.

“අනේ..... අනේ අම්මේ, ඔයා කොහේද? මට බයයි. මාව බේර ගන්නකෝ. අනේ... අනේ....” කොටි පැටවා කෑ ගැසීය.

“ම්ම්ම්...... ඒ අර කොටි පැටියෙක් නේද?”

“ආනේ ඔව් කරදරයක් වගේ. අපි උදව් කරමුද?”

“එපා, එපා අපි අම්මට කියමු”

“ඔව් ඔව් අපි අම්මට කියමු. එතකොට අම්මා මොනවහරි කරයිනේ.....” තවත් පූස් පැටවෙකු පිළිතුරු දුන්නේය.

කොටි පැටවාගේ කෑ ගැසීම ඇසුණු පූස් පැටවුන් වහා දිවගොස් ඒ බව තම මවට පැවසුවා.

“අම්මේ, අම්මේ.....” පූස් පැටවුන් හති අරිමින් කෑ ගැසූහ.

“අනේ අම්මේ ඉක්මනින් එන්නකෝ,.....”


“මොකද මොකද මේ කෑ ගහන්නේ? මොකක් හරි කරදරයක් වුණාද?”

“කරදරයක් නම් තමා. ඒත් අපිට නම් නෙවේ.”

පූස් පැටවුන් සිදු වූ දෙය අකුරක් නෑර මවට පැවසීය.



ඒ බව ඇසූ පූස් මව වහාම තම පැටවුන් සමග කොටි පැටවා සිටි ස්ථානයට ගොස් සර්පයා පලවා දමා කොටි පැටවා බේරා ගත්තා. බියේ ගැහෙමින් සිටි කොටි පැටවා ඉක්මනින් සතුටට පත් වී පූස් මවට ස්තූති කර තම මව සිටි ස්ථානයට ගියා.



ඉක්මනින්ම තම මව හමුවීමට ගිය කොටි පැටවා සිදු වූ සියල්ල අකුරක් නෑර තම මවට පැවසුවා. ඒ බව ඇසූ කොටි මව පුදුමයට පත් වූ අතර පූස් මව පිළිබඳව පැහැදීමක් ඇති වූවා.

ටික වේලාවකට පසු කොටි මව තම පැටව් දෙදෙනා සමග පූස් මව හමුවීමට ගියා. ඈතින් කොටි මව සහ පැටවුන් එනවා දුටු පූස් පැටවුන් වහා ගොස් ඒ බව තම මවට පැවසූවා.

ඒ බව ඇසූ පූස් මව බියට පත් වූවා. කොටි මවස හ පැටවුන් එන්නේ මන්දැයි

සිතුවා. දවාලයේ තමා විසින් සිදුකළ කාර්යයද වහා පූස් මවගේ සිතට එබිකම් කළා. එවිට කොටි මව එතැනට පැමිණ,

"බොහොම ස්තුතියි පූස් අම්මේ මගේ පැටියව බේරගත්තට. බය වෙන්නෙ එපා මං ඔයාලට කරදර කරන්න නෙවේ ආවේ."

යැයි පවසා පූස් මවව වැළඳ ගත්තා.

පූස් මව පුදුමයට පත් වූවා. එසේම කොටි පැටවුන් තම පැටවුන් සමග විනෝද

වෙනවා දැක ඉහමත් සතුටට පත් වූවා. එය දුටු කොටි මවද සතුටට පත් වූවා.

එතැන් පටන් කොටි පවුල හා පූස් පවුල සතුටින්, විනෝදයෙන්, සාමකාමීව දිවි ගෙව්වා.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත්පත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් "හේමමාලා උපහාර" ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ

ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, වියුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)